**ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මූලපිරීම් ව්‍යාපෘතිය (අදියර 01) - 2016**

-----------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා නිරිතදිග නාගරික සෞඛ්‍යාරක්ෂණ හා සනීපාරක්ෂණ මූලපිරීම් ව්‍යාපෘතියේ (අදියර 01) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඒජන්ස් ෆ්‍රාන්සස් ඩී ඩිවෙලොප්මන්ට් අතර 2016 ජූනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, අප ජලය රැස්කිරීම හා පිරිසිදු කිරීමේ පද්ධති ව්‍යාප්ත කිරීම හා 73,000 ක් වූ ජනතාව සඳහා සනීපාරක්ෂක සේවා සඳහා  ප්‍රවේශය වැඩි දියුණු කිරීම, දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම මඟින් අවාසි සහගත නිවැසියන් සඳහා සේවා ප්‍රවේශයට පහසුකම් සැලසීම සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්ව පවත්වා ගැනීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ඒජන්ස් ෆ්‍රාන්සස් ඩී ඩිවලොප්මන්ට් එකඟ වී තිබුණි. රු.මිලියන 4,524 කට සමාන ඉතිරි යූරෝ මිලියන 26 ක ශේෂය ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට  අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි· කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය හා ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව. සහ

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

-------------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

-------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | | ණය පහසුකම් ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2016 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කරන ලද අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | | යූරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| ඒඑෆ්ඩී - | ණය | 76.00 | 13,224.00 | - | - | - |
| | ප්‍රදාන | 5.70 | 991.81 | - | - | - |
| ශ්‍රී ලං ර | | 26.00 | 4,524.00 | 10 | 0.02 | 3.4 |
| | එකතුව | **107.70** | **18,739.81** | **10** | **0.02** | **3.4** |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ලියකියවිලි අනුව, අප ජලය පිරිසිදු කිරීමේ පිරියතක් ඉදිකිරීම ඇතුළත්ව මීගමුව ප්‍රදේශයේ සනීපාරක්ෂක යටිතල පහසුකම් සැපයීම, ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය සැපයීම සහ සැලසුම් හා ඉංජිනේරු කාර්යයන් ආදිය සඳහා උපදේශක සේවා සැපයීම නම් වූ සංරචක 03 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘති නියාමන ඒකකය ස්ථාපිත කිරීමට හා උපදේශකවරුන් ප්‍රසම්පාදනය කිරීම ආදිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ආරම්භක පියවරයන් ගෙන තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

2015 ජුලි 28 දිනැති අංක එම්එෆ්එස්/පීඒ/සීපී/15/148 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, ණය ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම, පාරිසරික හා සමාජ නිෂ්කාශනය ආදී ව්‍යාපෘතියට අදාළ සියලු පෙර සූදානම් අවශ්‍යතාවයන් තහවුරු කර ගැනීම සඳහා එවකට නාගරික සංවර්ධනය, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගැනීමට යටත්ව ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමට මුදල් අමාත්‍යාංශය එකඟ වී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් පරිසරය හා සමාජයීය ගැටලු, පිළිබඳ නිෂ්කාශනය 2016 දෙසැම්බර් 31 වන විටත් අදාළ පාර්ශවයන්ගෙන් ලබාගෙන නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

ව්‍යාපෘතිය විසින් 2016 දෙසැම්බර් මාසයේදී සිවිල් ඉංජිනේරුවරුන් දෙදෙනෙකු බඳවා ගෙන තිබූ නමුත් "මොරටුව හා ඒකල ප්‍රදේශය සඳහා නළ ජලය අපවහන ආවරණය පුළුල් කිරීම" නම් වූ වෙනත් ව්‍යාපෘතියක් සඳහා 2017 ජනවාරි සිට එම නිලධාරීන් මුදාහැර තිබුණි.